# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල

| | | | | | |
|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 1844 / 2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 | දිනය<br>திக<br>Date | 13/12/2024<br>පැය 1950 |

## මාධ්‍ය නිවේදනය

**ප්‍රධාන කර්තෘ / ප්‍රවෘත්ති කර්තෘ,**
**අධ්‍යක්ෂ ප්‍රවෘත්ති / ප්‍රවෘත්ති කළමණාකරු,**
**සියළුම මාධ්‍ය ආයතන.**

**හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා ඇතුළු හිටපු ජනාධිපතිවරුන්ගේ ආරක්ෂාව අඩු කර ඇති බවට ජනමාධ්‍ය මඟින් පල වූ පුවතක් පිළිබඳව කරුණු පැහැදිලි කිරීම - පොලිස් මූලස්ථානය**

හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතාගේ ආරක්ෂාව සඳහා යොදවා සිටි ආරක්ෂක නිලධාරීන් සංඛ්‍යාව අඩුකර ඇති බවත්, එමඟින් හිටපු ජනාධිපතිතුමා වෙත යම් තර්ජනයක් හෝ හානියක් සිදු වුවහොත් එහි වගකීම අදාල අංශ භාර ගතයුතු බවටත් මේ දිනවල ජනමාධ්‍ය ඔස්සේ පුවතක් සංසරණය වෙමින් පවතී.

වත්මන් රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශනයෙහි දක්වා ඇති විශ්‍රාමික ජනාධිපතිවරුන්ගේ වරප්‍රසාද අහෝසි කිරීම යන ප්‍රතිපත්තිමය තීරණයට අනුව කටයුතු කරමින් රජය විසින් ප්‍රභූ ආරක්ෂාව සඳහා නිලධරයන් අනුයුක්ත කිරීම සම්බන්ධයෙන් ක්‍රියා කිරීමට පත් කර ඇති කමිටුව මඟින් හිටපු ජනාධිපතිවරුන්ගේ ආරක්ෂක තක්සේරු වාර්තා සහ ඒ සඳහා ශ්‍රී ලංකා පොලිසිය දරන වැය බර සමාලෝචනයට ලක් කර ඇත.

හිටපු ජනාධිපතිවරුන්ගේ ආරක්ෂක කටයුතු ආවරණය කිරීම සඳහා අනුයුක්ත කර සිටින පොලිස් නිලධාරීන්ගේ වැය බර වාර්ෂිකව රුපියල් මිලියන 1100 ක් වන බව නිරීක්ෂණය කර ඇත. එහිදී, හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතාගේ ආරක්ෂාව වෙනුවෙන් වාර්ෂිකව මිලියන 326 කට වැඩි වැය බරක් දරනු ලබයි.

ඒ අනුව, මහින්ද රාජපක්ෂ මහතා ඇතුළු හිටපු ජනාධිපතිවරුන් සඳහා ආරක්ෂක නිලධාරීන් සංඛ්‍යාව 60 ක් දක්වා සංශෝධනය කර පවත්වාගෙන යාමට තීරණය කර ඇති අතර එම සංඛ්‍යාවට අමතරව වරින් වර කමිටුව රැස් වී තක්සේරු වාර්තා කැඳවා නිලධාරීන් සංඛ්‍යාව අඩු කිරීමට හෝ වැඩි කිරීමට කටයුතු කරන අතර හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා ඇතුලු හිටපු ජනාධිපතිවරුන්ගේ ආරක්ෂාව සඳහා සන්නද්ධ සේවාවල සමාජිකයින්ද යොදවා ඇත.

ශ්‍රී ලංකා පොලීසියේ සාමාන්‍ය පොලිස් රාජකාරි සඳහා දැනටමත් නිලධාරීන් 24000 ක පමණ ඌණතාවයක් පවතී. එමෙන්ම මෙයට පෙර ජනාධිපති ආරක්ෂක කොට්ඨාසය සහ අග්‍රාමාත්‍ය ආරක්ෂක කොට්ඨාසයෙහි ප්‍රභූ ආරක්ෂක රාජකාරි යොදවා සිටින නිලධාරීන් 2000 කට අධික පිරිසක් ඉන් ඉවත් කර සාමාන්‍ය පොලිස් රාජකාරි සඳහා අනුයුක්ත කර ඇත. තවද අමාත්‍යවරුන් හෝ මන්ත්‍රීවරුන්ගේ ආරක්ෂාව සඳහා පොලිස් නිලධරයන් යෙදවීමක් සිදුකර නොමැත. මෙලෙස ප්‍රභූ ආරක්ෂාව සඳහා යොදවා ඇති නිලධාරීන් සංඛ්‍යාව අඩු කිරීම මඟින් අපරාධ මර්ධනය ඇතුළු අනෙකුත් රාජකාරි සඳහා ප්‍රාදේශීය පොලිස් ස්ථාන වලට ප්‍රමාණවත් පොලිස් නිලධාරීන් යොදවා ගැනීමට හැකි වී ඇත.

ප්‍රභූ ආරක්ෂාව වරින් වර සමාලෝචනය කිරීම හා තක්සේරු කිරීමත්, ඊට අනුරූපිව මානව හා භෞතික සම්පත් යෙදවීමත්, ප්‍රභූ ආරක්ෂාවේ මූලික සිද්ධාන්තයක් වේ. එසේම හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතාගේ ආරක්ෂාව සඳහා පොලිස් නිලධාරීන්ට අමතරව හමුදා නිලධාරීන්ද යොදවා සිටින බැවින් ඒ මහතාගේ ආරක්ෂාව කිසිඳු ආකාරයකින් බිඳ වැටී නොමැති බව නිරීක්ෂණය වේ.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**